(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 103.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 සැප්තැම්බර් මස 23 වැනි සිකුරාදා පූ. භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා,** වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු **බන්දුල ගුණවර්ධන මහතා**

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා**

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා**

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු වමල් රාජපක්ෂ මහතා

**ගරු අංගජන් රාමනාදන් මහතා**

**ගරු ගාමිණී ලොකුගේ මහතා**

**ගරු ජානක වක්කුඹුර මහතා**

**ගරු විදුර වික්‍රමනායක මහතා**

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**

**ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා**

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු කංචන විජේසේකර මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු ඊ. සරවනපවන් මහතා**

**ගරු මුත්තු සිවලිංගම් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

නීල් ඉද්දවල මහතා, වැඩබලන පාර්ලිමේන්තුවේ මහලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව එම කාරක සභාවේ සභාපති ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා වෙනුවෙන් එහි සභික ගරු (මහාචාර්ය)

ආශු මාරසිංහ මහතා විසින්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද **"ජාතිය ගොඩනැඟීමේ බදු (සංශෝධන)"** නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන්වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**3. පෙත්සම් :**

මහනුවර, මාවිල්මඩ පාර, දෙවන පටුමග, අංක 45/5 දරන ස්ථානයෙහි පදිංචි එම්. එල්. එම්. සබ්රි මහතාගෙන් ලැබුණු 2016.08.30 දිනැති පෙත්සම ගරු අබ්දුල් හලීම් මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. ශෝක ප්‍රකාශ යෝජනා** : (i) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, අභාවප්‍රාප්ත ගරු ඩී. එම්. ගුණසේකර මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ඩී. එම්. ගුණසේකර මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම ඉදිරිපත් කරන්නට යෙදුන ශෝක ප්‍රකාශ අනුමත කරමින් ඊට එක් වූ කථානායකතුමා මෙම යෝජනාවට සම්බන්ධ දිනට නියමිත පාර්ලිමේන්තු විවාද නිල වාර්තාවේ (හැන්සාඩ්) පිටපතක් ශෝකයට පත් පවුලේ අය වෙත යවන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට නියෝග කළේය.

**රැස්වීම තාවකාලිකව අත්හිටවීම**

පූ. භා. 11.53

අ. භා. 1.30 වන තෙක් රැස්වීම තාවකාලිකව අත්හිටවන ලදී.

අ. භා. 1.30

රැස්වීම යළිත් එක්රැස්වූයෙන් කථානායකතුමා මූලාසනාරූඪ විය.

(අ. භා. 1.30 ට කථානායකතුමා මූලාසනාරූඪ විය.)

(ii) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, අභාවප්‍රාප්ත ගරු ඉන්දික ගුණවර්ධන මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ඉන්දික ගුණවර්ධන මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම ඉදිරිපත් කරන්නට යෙදුන ශෝක ප්‍රකාශ අනුමත කරමින් ඊට එක් වූ කථානායකතුමා මෙම යෝජනාවට සම්බන්ධ දිනට නියමිත පාර්ලිමේන්තු විවාද නිල වාර්තාවේ (හැන්සාඩ්) පිටපතක් ශෝකයට පත් පවුලේ අය වෙත යවන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට නියෝග කළේය.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම් :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුව විසින් 2016.03.08 වැනි දින සම්මත කරන ලද යෝජනාවේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 10.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.30 සිට අ. භා. 6.30 දක්වා ද විය යුතු ය. අ. භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු මලිත් ජයතිලක මහතා, ගරු සන්දිත් සමරසිංහ මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"රජිත කොඩිතුවක්කු පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**7. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 4.42 ට, 2016 ඔක්තෝබර් මස 04 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.